# දෙවන වාර පරීක්ෂණය - 2018
# 8 ශ්‍රේණිය
# පුරවැසි අධ්‍යාපනය

## I කොටස

- ❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- ❖ **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. පොදු සේවා සපයන ආයතනයක් නොවන්නේ,

i. ශ්‍රී ලංකා පොලීසිය ii. මධ්‍යම පරිසර අධිකාරිය
iii. විවිධ සේවා සමූපකාර සමිතිය iv. සන්නිවේදනය

02. තැපැල් සේවය මගින් ජනතාවට සැපයෙන සේවාවක් නොවන්නේ,

i. මුද්දර විකිණීම ii. මහජන ආරක්ෂාව සැපයීම
iii. දුරකථන පහසුකම් iv. මුදල් ඇණවුම් මගින් මුදල් යැවීම.

03. අනුගාමිකයෙකු වන්නේ,

i. විහාරාධිපති ii. මන්ත්‍රීවරයා iii. විදුහල්පති iv. ස්වාමීන් වහන්සේලා

04. පොදු සේවාවක් නොවන්නේ,

i. විදුලිය ii. ධීවර කටයුතු iii. තැපැල් iv. සමූපකාර

05. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ සේවාවක් නොවන්නේ,

i. ප්‍රවාහනය ii. බැංකු සේවා
iii. සමූපකාර සේවාව iv. තැපැල් හා විදුලි පණිවිඩ සේවා

06. ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතු විය යුතු ගුණාංගයක් නොවන්නේ,

i. අවංකකම ii. සවන් දීම
iii. අභියෝග මග හැරීම iv. ආත්මවිශ්වාසය

07. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අධ්‍යයන කරන විට, ආගම අනුව ජනගහණය බෙදීමේ දී දෙවන ස්ථානය හිමි වන ආගම වන්නේ,

i. ඉස්ලාම් ii. කතෝලික iii. බෞද්ධ iv. හින්දු

08. ඉස්ලාම් බැතිමතුන් විසින් සමරනු ලබන උත්සවයක් නොවන්නේ,

i. පාස්කු උත්සවය ii. මිලාදුන් නබි උත්සවය
iii. රාමසාන් උත්සවය iv. හජ්ජි උත්සවය

09. ස්වභාවික විපතක් නොවන්නේ,

i. භූමිකම්පා ii. රිය අනතුරු iii. අකුණු ගැසීම් iv. නියඟ

10. අයහපත් චිත්තවේග සමනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයක් නොවන්නේ,

i. මිතුරන් ඇසුරු කිරීම ii. මනස සන්සුන් කිරීමේ අභ්‍යාස

iii. නිර්මාණකරණය සඳහා යොමු වීම iv. විවිධ ගැටුම් ඇතිකර ගැනීම

(2x 10=20)

❖ **11 - 15 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

11. ...................................................... ළමා අයිතිවාසිකමක් වේ.

12. .......................................... පාසල තුල දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් ලෙස දැක්විය හැක.

13. ...................................................... අරමුණු කරගෙන පවත්වා ගෙන යාම පොදු සේවාවක ලක්ෂණයකි.

14. ...................................................... පැවැත්වීම සෞඛ්‍ය සේව මගින් ඉටු වන කාර්යයකි.

15. ...................................................... චිත්තවේගයක් නිසා ඇතිවන ප්‍රතික්‍රියාවකි.

(නායකත්වයට ගරු කිරීම, අධ්‍යාපනය ලැබීම, වෛද්‍ය සායන, හැඬීම, මහජන ප්‍රසිද්ධිය)

(ලකුණු 2 X 5 = 10)

❖ **16 - 20 දක්වා ප්‍රශ්න සඳහා හරිනම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.**

16. නිර්මාණශීලී බව ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතු ගුණාංගයකි. ( )

17. පුද්ගලයා තුල ඇති වන විවිධ චිත්තවේගී ස්වභාවයන් ඔහුගේ හැසිරීම කෙරෙහි බල නොපායි. ( )

18. ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්ම සමාජයේ යහපැවැත්මට හේතු වේ. ( )

19. ලෝකයේ සියළුම රටවල බහු සංස්කෘතික සමාජ දැකිය හැක. ( )

20. ස්වභාවික විපත් ඇති වීම කෙරෙහි මිනිස් ක්‍රියාකාරකම් බලපාන්නේ නැත. ( )

(ලකුණු 2 X 5 = 10)

## <u>II කොටස</u>

❖ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

01. i. පොදු සේවාවක් යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

ii. පොදු සේවා මහජනතාව වෙත සපයන ආකාරය අනුව ඒවා ප්‍රධාන කොටස් 03 කට බෙදිය හැක. ඒවා මොනවාද? (ලකුණු 3)

iii. පොදු සේවා සඳහා උදාහරණ 02 ක් දක්වා ඒවායේ පොදු ලක්ෂණ 02 ක් ලියා දක්වන්න. (ලකුණු 5)

02. i. සෞඛ්‍ය සේවය මගින් ඉටු කරනු ලබන කාර්යයන් 02 ක් ලියන්න. (ලකුණු 2)

ii. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් ඔබට සපයන සේවාවන් 03 ක් ලියන්න. (ලකුණු 3)

iii. විදුලි බලයෙන් ඉටු කර ගත හැකි අත්‍යවශ්‍ය කාර්යයන් 05 ක් ලියා දක්වන්න. (ලකුණු 5)

03. i. ඔබ ප්‍රදේශයේ පාසල් වල කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට අවශ්‍ය පහසුකම් ලබා දීමට සහය වන සමීපතම ආයතන 02 නම් කරන්න. (ලකුණු 2)

ii. ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයක සේවය කරන කාර්ය මණ්ඩල සේවකයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 3)

iii. ආරක්‍ෂක හමුදාවෙන් ඉටු වන සේවාව කරුණු 3 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

04. i. පවුලක ස්වභාවය අනුව එය වර්ග 02 කට බෙදා දැක්විය හැක. එම වර්ග 02 නම් කරන්න. (ලකුණු 2)

ii. පවුල තුල දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 03 ක් ලියා දක්වන්න. (ලකුණු 3)

iii. පාසල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 03 ක් දක්වා ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ වර්ධනය කර ගැනීමට පාසල තුල ඇති අවස්ථා 02 ක් සඳහා උදාහරණ දක්වන්න. (ලකුණු 5)

05. i. ළමා අයිතිවාසිකම් 02 ක් ලියා දක්වන්න. (ලකුණු 2)

ii. ළමා යුතුකම් 03 ක් දක්වන්න. (ලකුණු 3)

iii. චිත්තවේගයන් 03 ක් නම් කර ඒ අනුව ඇතිවන ප්‍රතික්‍රියා 02 බැගින් ලියා දක්වන්න. (ලකුණු 5)

06. i. සමාජයක් තුල දැකිය හැකි නායකත්ව ශෛලීන් 02 ක් නම් කරන්න. (ලකුණු 2)

ii. ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතු විය යුතු ගුණාංග 3 ක් ලියන්න. (ලකුණු 3)

iii. නායකයා සහ අනුගාමිකයා අතර පවතින සම්බන්ධතාව කරුණු 04 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

07. i. සංස්කෘතිය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

ii. ශ්‍රී ලංකාවේ දැකිය හැකි ප්‍රධාන ආගම් 03 ක් නම් කර, ඒ එක් එක් ආගමට අයත් උත්සව 02 බැගින් නම් කරන්න. (ලකුණු 3)

iii. බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ 03 ක් නම් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

08. i. අනතුරු හා විපත් ඒවායේ ස්වභාවය අනුව ප්‍රධාන කොටස් 02 කට බෙදිය හැක. ඒවා නම් කරන්න. (ලකුණු 2)

ii. ඔබ නම් කල කොටස් 02 සඳහා උදාහරණ 02 බැගින් දක්වන්න. (ලකුණු 3)

iii. ස්වභාවික විපත් 02 ක් කෙටියෙන් පැහැදිලි කර ඒවායෙන් ඇති වන හානි වලක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග 02 බැගින් ලියන්න. (ලකුණු 5)